


# W.A. සතිනි යෙතුම්සා වීරසිංහ

# ජිරාෆ්ගේ මල් මාලේ

ISBN - 978-624-211-409-5
(4 වන E පොත දිගහැරුම)

**W.A. සතිනි යෙතුම්සා වීරසිංහ**

**මහාමායා බාලිකා විදුහල - මහනුවර**

7 ශ්‍රේණිය F

2026

**වෙනත් කෘති**

ඉවි සහ එලා - (ISBN : 978-624-96932-1-0)
ආදර අම්මා සහ අප්පච්චි - (ISBN : 978-624-96932-0-3)
The Shapes - (ISBN: 978-624-96932-2-7)
වැරදුණු උගුල - (ISBN : 978-624-206-653-0)
සුදු මහත්තයාගේ ඇස් - (ISBN : 978-624-206-921-0)
දෙයියෝ කෝපවෙලා - (ISBN : 978-624-208-329-0)

# ~පිදුම~

මහාමායා බාලිකා විදුහලේ 94වන සංවත්සරය
වෙනුවෙන් සංවිධාන කරන

හේමමාලා උපහාර E - book ව්‍යාපෘතියට සමගාමීව

මා විසින් රචනා කරන ලද මෙම ග්‍රන්ථය

මාගේ සෙවනැල්ල මෙන් ළඟ සිටින

ආදරණීය අම්මාට හා අප්පච්චිට මෙය පිදුමක් ම වේවා!

එමෙන් ම ගරු විදුහල්පතිතුමිය ඇතුළු මෙම
ව්‍යාපෘතියේ දී

සහයෝගය දුන් සියලුම දෙනාට ද

මෙම සංකල්පය අප වෙත ළඟා කරදුන්

සෙනෙවිරත්න ගුරු පියාණන්ට ද මෙම පොත
සැකසීමට උපකාර කල තනූජා රත්නායක නැන්දාට ද
මෙය පිදුමක් වේවා !



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කල හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවර ද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කල ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන්ට මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර,

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා විද්‍යාලය.

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව

ඔන්න එක්කොමත් එක රටක ලස්සන කැලයක් තිබුණා.

ඒ කැලේ පාමුලින්ම නිල් කැටේට වතුර බහින ලස්සන ඇලකුත් තිබුණා.

මේ කැලේ රසම රස පලතුරු, ලොකු පොඩි වැල්, සුවඳ මල්වලින් හැඩ වෙලා තිබුණා. ඒ මල්වලින් සුවඳ බලන්න එන සමනල්ලු
වෛ වර්ණයෙන් පිරුණා.


හැමදාම කැලයේ කොළපාටින් බැබලුනා. ගස් අතරින් රන්වන් පාටට වැටෙන හිරු රැස් පොළොව සිඹ ගත්තා.

තෙතමනය නිතර තිබුණ නිසා කකුල් ගොඩාක් ඇති හැකරැල්ලන්ට මෙතන පාරාදීසයක්. පුංචි පුංචි කුරුමිණියන් කරණන් ගසමින් එහෙ මෙහෙ ගියා.

සත්තු හරි අපූරුවට මේ කැලේ ජීවත් වුණා. කැලේ සත්තු හැමෝටම ආදරය කරන එක අක්ක කෙනෙක් හිටියා. එයාගෙ නම සුකී. කැලේ අයට අසනීප උනාම සුකී අක්කි තමයි බෙහෙත් ගෙනත් දාන්නේ.

මේ කැලේ සත්තු හැමදාම උදේට එක තැනකට එකතුවෙලා සාකච්ඡා කරනවා "අපි අද කෑම හොයාගන්නේ
කොහෙන් ද ?", කියලා. ඒ අතරෙ සමහර සත්තු කෑම හොයන්න එකට එකතුවෙලාත් යනවා.

මේ සත්තු කවමදාකවත් රණ්ඩු කරගත්තේ නැහැ. මෙයාලා හරිම එකමුතුයි. ඒක නිසාම සුකී අක්කී මේ කැලේට කිව්වෙ "සමගි කැලේ" කියලා.



සත්තු කෑම හොයා ගන්න එහෙට මෙහෙට යද්දි අර මන් කලින් කිව්ව නිල් කැටේට වතුර ගලන ඇල හරහා යන්න වෙනවා. ඒ හින්දා සත්තු සේරම එකතුවෙලා එගොඩ මෙගොඩ යන්න පාලමක් හදා ගත්තා.මේ පාලම හදන්න කොට ගෙනාවෙ අලි පැටව්.


එතකොට මේ කොට එකට තියලා ගැට ගහන්න වැල් හොයලා දුන්නෙ ඉත්තෑවොයි, මුගටියොයි, දඬුලේන්නුයි. හැම දවසෙම මේ කට්ටියම සතුටින් ජීවත් වුණා.

ඔන්න දවසක් මුළු අහසම කළු කරලා, ගස් පැද්දෙන්න හුළං හමලා, අහස ගුගුරවමින් මුළු පරිසරයම අඳුරු කරලා මහ වැස්සක් වහින්න ගත්තා. මේ වැස්සෙන් බේරෙන්න

සත්තු හැමෝම ගුහාවලට, ගස්වල බෙන අස්සට කොහොම කොහොම හරි රිංග ගත්තා.

නිල් කැටේට වතුර ගලන් ගිය අර ඇල, මඩ පාට ජල කඳකින් පිරී ගියා. මහ තරහකින් වගේ, ඇලේ වතුර වේගයෙන් පහළට ගලන් ගියා.

අනේ දෙවියනේ! හැමෝම මහන්සියෙන් හදපු පාලම, කැකි කැලිවලට කැඩිලා ගියා.



දවසක් ගත වුනා. දැන් වැස්ස නතර වුනා. හැමෝම ගුහාවලින් එළියට ඇවිත් බැලුවා. යාලුවෝ ඔක්කොම කිසිම කරදරයක් නැතුව මහ වැස්සෙන් බේරිලා.

එකම පාඩුව වුණේ පාලම කැඩුණ එක. "දැන් ඉතිං එහා ඉවුරේ ඉන්න
අපේ සුකී අක්කා මේ පැත්තට එන්නෙ කොහොමද ? ඇයි අපේ
අනිත් යාලුවෝ, අපි එයාලව බලන්න යන්නේ කොහොමද ?" හාවා ඇහුවා.

"ආ...ඒක පොඩි වැඩක්. මන් උදව් කරන්නම්. මන් බෙල්ල දික් කරන්නම්. ඒකෙ නැගලා ඔයාල යන්න" ජිරාෆ් කිව්වා.
ඉතිං ජිරාෆ්ගේ බෙල්ලේ නැගල බොහෝ සත්තු එගොඩ මෙගොඩ ගියා.

බර දරාගෙන, දණ බිම තියාගෙන හිටිය ජිරාෆ්ගේ කකුලත් දැන් හොදටම රිදෙනවා. කකුල කොච්චර රිදෙනවාද කියනවා නම් නමන්න බැරි තරම් අමාරුයි.

ජිරාෆ් වේදනාවත් දරාගෙන සත්තු බොහෝදෙනෙක් වෙනුවෙන් කල උදව්ව අගය කරන්න ඕනේ. "අපි මෙකට ජිරාෆ්ට මල් මාලයක් දාමු" කියලා සුකී අක්කා යෝජනා කළා.
හැමෝම ඒකට කැමති උනා.



ලස්සනට හදපු මල් මාලේ ජිරාෆ්ගේ බෙල්ලට දාන්නේ කොහොමද ? සත්තු කල්පනා කලා. හැමෝම එකට එකතුවෙලා එකා උඩ එකා නැගලා සත්තු ඉණිමගක් හැදුවා. ඒක දිගේ සුකී අක්කි උඩට ම නැග්ගා.

මේ අතරේ හිපපොටේමස්ගේ නහයේ දඬුලේනගේ වලිගය ටිකක් වැදුණා. හිපෝට ඒකට නහය කිචි ගතියක් දැණුනා. ඒක ඉවසගන්න බැරි උන හිපෝට "හචී........ස්" ගාලා ලොකු කිඹුහුමක් ගියා.



ඒක කකොච්චර ලොකුද කිව්වොත්, එක උඩ එකා නැග්ග ඉණිමග "දඩා....ස්" ගාලා වැටුණා. එහෙම වැටෙණවාත් එක්කම අර මල් මාලය උඩින් ගිහින් පීරාෆ්ගේ බෙල්ලට වැටුණා.

හැමෝටම හොදටම හිනා මේ උන වැඩේට. සතුට වැඩි කමට පීරාෆ්ගේ කකුලෙ අමාරුවත් හොද උනා.

අපි හෙට උදෙන්ම අලුත් පාලමක් හදමු. හැමෝම කතා උනා.




# නිමි



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින් ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමෙතුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්යය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)